# සහන සත්කාර සේවය ශ්‍රී ලංකාවේ ප්‍රවර්ධනය කිරීමට
# ජාතික මුලෝපායික ක්‍රියාරාමුව
# 2018-2022

## සහන සත්කාරය හඳුන්වාදීම

සහන සත්කාරය (Palliative care) යනු ජීවිතයට තර්ජනයක් වීමේ අවධානමක් ඇති රෝගවලින් පීඩා විඳින රෝගීන් සහ පවුලේ සාමාජිකයින් මුහුණ දෙන වේදනාව සහ අනෙකුත් කායික, මානසික, සාමාජීය සහ ආධ්‍යාත්මික ගැටළු කලින් හඳුනාගැනීම, පරිපූර්ණ නිවැරදි ඇගයීම සහ ප්‍රතිකාර මගින් ඔවුන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රවේශයකි. (ලෝක සෞඛ්‍ය සංවිධානය)

සහන සත්කාරය ආරම්භ වන්නේ යම් පුද්ගලයෙකුට පිළිකාව වැනි ජීවිතයට තර්ජනයක් වීමේ අවදානමක් ඇති රෝගී තත්ත්වයක් මාරාන්තික රෝගයක් ඇති බවට නිශ්චය කරගත් මොහොතේ සිටය. මෙය එම රෝගියා මිය යන තෙක් පමණක් නොව පවුලේ අයගේ වියෝදුක් කාලය ගෙවී යන තෙක් පැවැත්වෙනු ඇත. "වත්මන් සංකල්පය" හෙවත් "වඩාත් හොඳ සංකල්පය" යැයි හඳුන්වනු ලබන මෙම සංකල්පය රූපසටහන 1 හි දක්වා ඇත.




රූපසටහන 1: සහන සත්කාර සේවා පැරණි සහ වත්මන් සංකල්ප අතර පරාසය
Ref. Murray, S. A et al. BMJ 2005;330:1007-1011

කොතැනක වාසය කළත් ආයුකාලය සීමාකරන රෝගාබාධයකට භාජනය වු පුද්ගලයෙකුට නම් අවශ්‍ය කරන සහන සත්කාර සේවා ලබාගැනීම ඔහු සතු අයිතිවාසිකමකි. එමෙන්ම, රෝගය හෝ රෝග අදියර, රෝගියාගේ වයස, ස්ත්‍රී පුරුෂ බව, ආගම, වාර්ගිකත්වය හෝ ආදායම් තත්ත්වය

ඇතුළු ඔහුගේ අනෙකුත් චරිත ස්වාභාවයන් නොසලකා අවශ්‍යතාවය අනුව එකී සත්කාරය ලබාදීම සෞඛ්‍ය සේවා වෘත්තීකයින්ගේ වගකීමක්ද වන්නේය.

වසරක් තුල ලොව සිදුවන මරණ සඛ්‍යාවෙන් 40%-60% පමණ ප්‍රතිශතයකට සහන සත්කාර සේවා අවශ්‍ය වන බව ඇස්තමේන්තු කර ඇත (WHO 2016). ගෝලීය සන්දර්භය තුල වැඩිහිටියන්ට සහ ළමුන්ට සහන සත්කාරයේ අවශ්‍යතාවය උද්ගත කරන ප්‍රධාන රෝගී තත්ත්වයන්වල ප්‍රතිශතය වගු 1 හි ලැයිස්තු ගත කර ඇත.

**වගුව 1: ගෝලීය සන්දර්භයෙහි සහන සත්කාර සේවා අවශ්‍යකරන ප්‍රධාන රෝගී තත්වයන්**

| වැඩිහිටියන්ට ඇති වන රෝග | ළමුන්ට ඇති වන රෝග |
|---|---|
| හෘදය රෝග (38.5%) | උපතින්ම ඇතිවන විකෘතිතාවයන් (25.0%) |
| පිළිකාව (34%) | නව්‍ය සූති තත්ත්වයන් (14.6%) |
| කල්ගත ස්වසන රෝග (10.3%) | ප්‍රෝටීන ඌනතාවය (14.1%) |
| එඩ්ස් (5.7%) | ආවෘතිදාහය (12.6%) |
| දියවැඩියාව (4.6%) | එච්.අයි.වී/එඩ්ස් (10.2%) |
| කල්ගත වකුගඩු රෝග | හෘදය රෝග (6.1%) |
| කල්ගත අක්මා රෝග | අන්තරාසර්ග, රුධිර සහ ප්‍රතිශක්තිකරණ ආබාධ (5.8%) |
| උන්මාදය | පිළිකාව (5.6%) |
| කල්ගත ස්නායු රෝග | ස්නායු ආබාධ (2.3%) |
| උපතින්ම ඇතිවන විකෘතිතාවයන් | වකුගඩු රෝග (2.2%) |
| ඖෂධ ප්‍රතිරෝධී ක්ෂය රෝගය | අක්මා සිරෝසියාව (1.0%) |

(WHO 2016)

ජනවිකාශණය සහ වසංගත රෝගවල වෙනස්වීම් සමගම කල්ගත බෝනොවන රෝග නිසා ඇති වන මරණ සංඛ්‍යාවද ඉහළ යමින් තිබෙන හෙයින් ඒ අනුව සහන සත්කාර සේවා සඳහා ලොවපුරා ඇති ඉල්ලුමද ඉහළ යමින් පවතී.

බෝනොවන රෝග මෙන්ම වියපත් ජනගහනයේ වැඩිවීමත් සමගම සහන සත්කාර සේවාවන්හි අවශ්‍යතාවයේ නොකඩවා වැඩිවීමක් ශ්‍රී ලංකාවේද දක්නට ඇත. ශ්‍රී ලංකාවේදී 2015 වර්ෂයේ සිදුවූ මරණවලට හේතු සම්බන්ධයෙන් කල අධ්‍යයනයකට අනුව, එම වසරේ මරණවලින් 75% ක්ම සිදුවී ඇත්තේ කල්ගත බෝනොවන රෝග නිසා බව පෙනී ගොස් ඇත. (රූපසටහන 2)




රූපසටහන 2 - 2015 ශ්‍රී ලංකාවේ මරණ දත්ත

## ශ්‍රී ලාංකීය සන්දර්භයෙහි සහන සත්කාර සේවාව

පුළුල් මුලෝපායික මගපෙන්වීමක් යටතේ, 2016-2025 ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියෙන් ''ගුණාත්මක පුනරුත්ථාපනයක් සඳහා සාධාරණ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම'' යන සංකල්පය හඳුනා ගෙන ඇත. ''සහන සත්කාරය අවශ්‍ය වන සියලුම රෝගීන්ට සිය ජීවිතය පවත්වා ගෙන යාමට සහ ගෞරවාන්විතව මරණයක් සඳහා අවශ්‍ය සේවාවන් ප්‍රධාන සෞඛ්‍ය ධාරාව තුලින්ම ලබා දිය යුතුය'', යන්න එහි අවධාරණය කර ඇත. මෙයට අමතරව ''කල්ගත බෝනොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ මුලෝපායික ක්‍රියාරාමුව (2010), ''පිළිකාව වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ මුලෝපායික ක්‍රියාරාමුව (2015)'', ''ජාතික වැඩිහිටි සෞඛ්‍ය ප්‍රතිපත්තිය'' (2017)

ඇතුලු ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රතිපත්ති ලියවිලි ගණනාවකම අඛණ්ඩව සැපයිය යුතු සත්කාරයක් ලෙස සහන සත්කාර සංකල්පය හඳුනා ගෙන ඇත.

එමෙන්ම '2016-2020' සෞඛ්‍ය ප්‍රධාන සැලැස්මේද සහන සත්කාරය හඳුනාගෙන ඇති අතර බෝනොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වන ජාතික බහු ආංශික ක්‍රියාකාරී සැලැස්මෙහිද මෙම සංකල්පයට ප්‍රමුඛ ස්ථානයක් ලබා දී ඇත.

## සමස්ත ඉලක්කය

සාධක පදනම්කරගත් හා බහුවිෂයික මෙන්ම ඵලදායි පිරිවැයකින් යුත් ප්‍රවේශයක් ඔස්සේ සාකල්‍ය සහන ක්‍රියාපටිපාටියක් තුලින් ජීවිතයට තර්ජනයක් වීමේ අවදානමක් සහිත රෝගවලින් පීඩා විඳින්නන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ගේ ජීවන තත්වය නංවාලීම මෙහි මූලික අරමුණයි.

සහය අවශ්‍ය වන ක්ෂේත්‍ර වලට පහත ද ඇතුලත් වේ.

- වේදනාව සහ රෝග ලක්ෂණ කළමනාකරණය
- මානසික, සංවේදීමය, සමාජීය හා අධ්‍යාත්මික සහය
- පුද්ගලයාගේ රෝගී තත්වයේදී සහ ඔහුගේ වියෝවෙන් පසු කාල පරිච්ඡේදයෙහිදී ඔහුගේ පවුලේ අයට සහ ඔහුව රැකබලාගන්නා අයට සහය ලබා දීම

## මෙහෙයුම් මූලධර්මයන්

1. ගරුත්වයකින් යුතුව සහන සත්කාරය ලබාදිය යුතු අතර එය, එම සේවාව ලබන්නන්ගේ, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ගේ සහ ඔහුව රැකබලා ගන්නන්ගේ අවශ්‍යතාවයන්, අගයයන් හා රුචිඅරුචිකම් වලට අනුකූල විය යුතුය.

2. සත්කාරය උසස් ප්‍රමිතියෙන් සහ සාධක මුල් කරගත් ඒවා විය යුතුය.

3. විවිධ සත්කාර ක්‍රම ආශ්‍රයෙන් විවිධ අංශ සමග ප්‍රමාණවත් බද්ධ වීමක් තිබිය යුතුය

4. සත්කාරක සේවාවන් සඳහා ප්‍රවේශය සියළු දෙනාටම හිමි විය යුතු අතර සමානාත්මතාවය තහවුරු කළ යුතුය

## මූලෝපායයන්

1. අංගසම්පූර්ණ සෞඛ්‍ය සත්කාරයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙසට සහන සත්කාරය පත් කිරීම හරහා එය සෞඛ්‍ය පද්ධතියේ අන්තර්ගත අංගයක් ලෙස පිළිගැනීමට ලක්කිරීම සහ එය සම්පතක් ලෙසින් භාවිතා කරනු ලැබීම තහවුරු කිරීම.

2. තෘතීයික, ද්වීතීක සහ ප්‍රාථමික මෙන්ම ප්‍රජා මට්ටමෙන් ඇති සියළුම සේවාවන් විශේෂඥ සහන සත්කාරයන් සහ අදාල සේවාවන් සමග ඵලදායී ලෙස බද්ධ කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීම.

3. ආයතනික සහ ප්‍රජා මට්ටම්වල සහන සත්කාර සේවා සැපයීම සඳහා විවිධ අංශවල පුහුණුව ලත් මානව සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය කර ලබා දීම.

4. සහන සත්කාර සේවාවන් අවශ්‍ය වන රෝගීන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට එම සේවාවන්, අදාල ක්‍රියාපටිපාටීන් වලට සහ මාර්ගෝපදේශවලට අනුකූලව අවශ්‍යවන ස්ථානයේ හා අවශ්‍ය අවස්ථාවලදී ලැබෙන බවට තහවුරු කිරීම.

5. සහන සත්කාරය තෘතීයික, ද්වීතීක සහ ප්‍රාථමික මෙන්ම ප්‍රජා යන සියලුම මට්ටම්වලට ලබා දීම සඳහා වන අත්‍යවශ්‍ය වන ඖෂධ සහ තාක්ෂණය ඇති බවට සහතික කරගැනීම.

6. සහන සත්කාරය ලබා දීම සඳහා රජය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග හවුල්කාරිත්වයක් ගොඩනගා ගැනීම.

7. සහන සත්කාරය උදෙසා පවුලේ සාමාජිකයන්, රැකබලා ගන්නන් මෙන්ම මහජනයා සවිබල ගැන්වීම.

8. සහනකාරී සත්කාර අවශ්‍යතාවයන් තක්සේරු කිරීමට සහ එම සේවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැකැස්මක් නිර්මාණය කිරීමට ඒ හා සම්බන්ධ පර්යේෂණ දිරිගැන්වීම.

9. ඵලදායි ලෙස සහන සත්කාරය ලබා දීමට අවශ්‍ය කරන මුල්‍ය ප්‍රතිපාදන හා අනෙකුත් සම්පත් වෙන් කර ඇති බවට තහවුරු කර ගැනීම.

10. සහන සත්කාරය සැපයීම සඳහා අවශ්‍ය වන නෛතික ක්‍රියාරාමුව ශක්තිමත් කිරීම.

11. සහන සත්කාර සේවා සඳහා අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ ක්‍රියාරාමුවක් සම්පාදනය කිරීම.

## මුලෝපායයන් සහ ප්‍රධාන ක්‍රියාකාරකම්

1. අංගසම්පූර්ණ සෞඛ්‍ය සත්කාරයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙසට සහන සත්කාරය පත් කිරීම හරහා එය සෞඛ්‍ය පද්ධතියේ අන්තර්ගත අංගයක් ලෙස පිළිගැනීමට ලක්කිරීම සහ එය සම්පතක් ලෙසින් භාවිතා කරනු ලැබීම තහවුරු කිරීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට සහන සත්කාරය හා සම්බන්ධ ප්‍රතිපත්ති ඇතුලත් කිරීම | සෞඛ්‍ය සේවා සැපයීමේදී සහන සත්කාරයට ප්‍රමුඛත්වයක් ලබාදීම | ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට සහන සත්කාරය ඇතුලත් කිරීම | ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්ති ලියවිල්ල | 2018-2019 | ලේකම් - සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්<br>අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ සංවර්ධනය |
| 2. සහන සත්කාර ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කර එය ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ අනෙකුත් සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන ප්‍රතිපත්ති සමග සම්බන්ධ කිරීම | සහන සත්කාරයට පුළුල් ප්‍රවේශ්‍යයක් ලබාදීම සඳහා පහසුකම් ලබාදීම | සහන සත්කාර ජාතික ප්‍රතිපත්තිය තිබීම (ස්ථාවර තනි ප්‍රතිපත්තිය) | සහන සත්කාර ජාතික ප්‍රතිපත්ති ලියවිල්ල | 2019-2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ සංවර්ධන |
| 3. සහන සත්කාරය අනෙකුත් අදාල සෞඛ්‍ය හා සෞඛ්‍ය නොවන ප්‍රතිපත්තීන් වල අංගයයක් ලෙසින් හඳුනාගැනීම | ප්‍රාථමික වැළැක්වීම, කලින්ම රෝගය හඳුනාගැනීම සහ ප්‍රතිකාර වැඩසටහන් ගණනාවකටම අඛණ්ඩ සත්කාරයක් ලෙස සහන සත්කාරය ඇතුලත් කිරීම | අනෙකුත් අදාල සෞඛ්‍ය ප්‍රතිපත්තීන් වලට සහන සත්කාරය ඇතුලත් කිරීම | අනෙකුත් සෞඛ්‍යය මුල්කර ගත් ප්‍රතිපත්ති ලියවිලි. උදා:<br>1. බෝනොවන රෝග ප්‍රතිපත්තිය<br>2. පිළිකා මර්දන ප්‍රතිපත්තිය<br>3. ප්‍රාථමික සත්කාර ප්‍රතිපත්තිය<br>4. වැඩිහිටි සෞඛ්‍ය සේවා ප්‍රතිපත්තිය<br>5. HIV/AIDS ප්‍රතිපත්තිය<br>6. ඖෂධ ප්‍රතිපත්තිය<br>7. මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තිය<br>8. ඊ-සෞඛ්‍ය ප්‍රතිපත්තිය<br>9. සමාජ සේවා ප්‍රතිපත්තිය | 2018-2020 | අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ සංවර්ධන<br>අධ්‍යක්ෂ - බෝනොවන රෝග<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>අධ්‍යක්ෂ - ප්‍රාථමික සත්කාරය<br>අධ්‍යක්ෂ - වැඩිහිටි සහ ආබාධ<br>අධ්‍යක්ෂ - ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන වැඩසටහන<br>අධ්‍යක්ෂ - සමාජසේවා අමාත්‍යංශය |
| 4. සහන සත්කාරය සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව ශක්තිමත් කිරීම | ජාතික ක්‍රමෝපාය සෑම මට්ටමකින්ම ක්‍රියාත්මක කර අධීක්ෂණය කිරීමට සක්‍රීය සම්බන්ධීකරණ කමිටු පිහිටුවා තිබීම | වසරකට පවත්වන රැස්වීම් සංඛ්‍යාව | මෙහෙයුම් කමිටුවේ රැස්වීම් වාර්තා | 2018-2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| 5. සහන සත්කාරය සම්බන්ධීකරණය කිරීමට පළාත් හා දිස්ත්‍රික්ක මෙහෙයුම් කමිටු පිහිටුවීම | දිස්ත්‍රික් හා පලාත් මට්ටමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමට සක්‍රීය කමිටු ඇති කිරීම | වසරකට<br>පවත්වන රැස්වීම් සංඛ්‍යාව | මෙහෙයුම් කමිටු රැස්වීම්වල වාර්තා | 2018- 2022 | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 6. සෞඛ්‍ය අමාත්‍යාංශ මට්ටමින් සහන සත්කාරය සඳහා වෙනම කේන්ද්‍රීය ස්ථානයක් හඳුනා ගැනීම | සහන සත්කාර ප්‍රවර්ධනය සඳහා මුලෝපායික ක්‍රියාරාමුවක් ක්‍රියාත්මක කිරීම ගැන සහතික වීම | කාර්ය මණ්ඩලය සමග වෙනම කේන්ද්‍රීය ස්ථානයක් තිබීම | සෞඛ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛනය | 2018-2022 | ලේකම් - සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් |
| 7. ජාතික, පළාත් හා දිස්ත්‍රික් සෞඛ්‍ය ප්‍රවර්ධන න්‍යාය පත්‍රයට සහන සත්කාරය අන්තර්ගත කිරීම | සියලුම පාර්ශවකරුවන් සහන සත්කාරය ලබාදීමෙහිලා සක්‍රීයව නියැලී සිටීම | ප්‍රවර්ධන සැලැස්මට අනුව ජාතික, පළාත් හා දිස්ත්‍රික්ක මට්ටම්වලින් සාර්ථකව පවත්වන ලද සහන සත්කාර සම්බන්ධ ක්‍රියාකාරකම් සංඛ්‍යාව | වාර්තා | 2018- 2022 | සෞඛ්‍ය සේවා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 8. සියලුම පාර්ශවකරුවන්ගේ ආධාරය ලබා ගැනීම සඳහා උපදේශක වැඩසටහන් පැවැත්වීම | සෑම පාර්ශවකරුවෙක්ම සහන සත්කාරය ලබා දීමෙහි සක්‍රීයව නියැලී සිටීම | මහජන සහයෝගිතා වැඩසටහන් සංඛ්‍යාව | උපදේශක වැඩසටහන්වල වාර්තා | 2018- 2022 | අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>අධ්‍යක්ෂ - ප්‍රාථමික සත්කාර<br>අධ්‍යක්ෂ - බෝනොවන රෝග<br>අධ්‍යක්ෂ - මහජන හෙද සෞඛ්‍ය සහ වෛද්‍ය සේවා<br>සහන සත්කාරය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ ජීවිතාන්ත සහ සහන සත්කාර කාර්ය සාධන බලකාය<br>සහන සත්කාර සේවා සංගමය<br>වෘත්තීය විද්‍යාල |

## 2. තෘතීයික, ද්විතීක සහ ප්‍රාථමික මෙන්ම ප්‍රජා මට්ටමෙන් ඇති සියළුම සේවාවන් විශේෂඥ සහන සත්කාරයන් සහ අදාල සේවාවන් සමග ඵලදායී ලෙස බද්ධ කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. රෝහල්වල සහන සත්කාර සේවා වෙනුවෙන්ම තෝරාගත් පැවරුම් කණ්ඩායම් පිහිටුවීම | පැවරුම් කණ්ඩායම්වල සාමාජිකයන්ට ඔවුන්ට පවරා ඇති ප්‍රධාන කාර්යයන් පිළිබඳව පැහැදිලි දැනුවත්වීමක් තිබේ | සහන සත්කාර කණ්ඩායම් සිටින රෝහල් සංඛ්‍යාව | වාර්තා | 2018- 2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>සහන සත්කාරය සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1), නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (බෝනොවන රෝග)<br>අධ්‍යක්ෂ - රෝහල් වෛද්‍ය සේවා |
| 2. සහන සත්කාරයට අදාල සියලුම ක්ෂේත්‍රවල සේවා ලබා දීම සඳහා තෘතියීක හා ද්වීතීක මට්ටම්වල *"සහන සත්කාර උපදේශන සේවා"* ආරම්භ කිරීම *(ඇමුණුම් 1 සහ 1.1)* | උපදේශකවරුන්, වෛද්‍ය නිලධාරීන්, හෙද නිලධාරින්, භෞත චිකිත්සකයින් වෘත්තිමය චිකිත්සකයින්, ඖෂධවේදීන්, සමාජ සේවකයන් යන අයගේ සහභාගීත්වයෙන් සහන සත්කාර උපදේශන සේවා ලබා ගැනීමේ හැකියා තිබීම | සහන සත්කාර උපදේශන සේවා සංඛ්‍යාව | වාර්තා | 2018- 2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>සහන සත්කාරය සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1),<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (බෝනොවන රෝග)<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ - රෝහල් වෛද්‍ය සේවා<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>අධ්‍යක්ෂ - බෝනොවන රෝග |
| 3. සමීපතම සහන සත්කාර උපදේශන සේවාව හරහා රජයේ, රාජ්‍ය නොවන සහ පුද්ගලික ගිලන ගිමන්හල් සම්බන්ධ කර ඒවා සායනික වශයෙන් පරීක්ෂා කර අධීක්ෂණයට ලක් කිරීම | සමීපතම සහන සත්කාර උපදේශන සේවාව සමග ගිලන ගිමන්හල් සම්බන්ධ කර ඒවායෙහි ක්‍රියාකාරකම් සායනික වශයෙන් අධීක්ෂණය කරනු ලැබීම | සියලුම ගිලන ගිමන්හල් අතුරින් සහන සත්කාර උපදේශන සේවාවන් සමග සෘජු සම්බන්ධතාවය ඇති ගිලන ගිමන්හල් සංඛ්‍යාව | වාර්තා | 2018- 2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්<br>සහන සත්කාරය සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 4. ප්‍රාථමික සත්කාර ආයතන සහ පවුලේ වෛද්‍යවරයා විසින් සිදුකරන සහන සත්කාරයන් | සහන සත්කාරය අවශ්‍ය වන්නන්ට ඔවුන්ගේ සමීපතම සෞඛ්‍ය පසුබිමක සිට එය ලබාදීම | ප්‍රාථමික සත්කාර පසුබිමෙහි සහන සත්කාරය ලැබූ රෝගීන් සංඛ්‍යාව | සමීක්ෂණ වාර්තා | 2018- 2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරි 1),<br>අධ්‍යක්ෂ - ප්‍රාථමික සත්කාරය<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>අධ්‍යක්ෂ - බෝනොවන රෝග වෘත්තීය විද්‍යාල |
| 5. ප්‍රාථමික සත්කාර ආයතන සහ වෛද්‍ය වෘත්තිකයින් සම්බන්ධ කරගනිමින් නිවස මුල්කරගත් සහන සත්කාරය පිළිබඳ නියමු ව්‍යාපෘති පැවැත්වීම සහ එය පුළුල් කිරීම | නිවස මුල්කරගත් සහන සත්කාර සේවා පුළුල් කිරීම පිළිබඳ අත්දැකීම් ලබාගැනීම | ආරම්භ කල නියමු ව්‍යාපෘති සංඛ්‍යාව,<br>නිවස මුල්කරගත් සහන සත්කාරය ලැබූ රෝගීන් සංඛ්‍යාව | නියමු ව්‍යාපෘති ඇගයීම් වාර්තා සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය | 2018-2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්- බෝනොවන රෝග<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරි 1 සහ 2),<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>අධ්‍යක්ෂ - ප්‍රාථමික සත්කාර<br>ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය<br>සහන සත්කාර සේවා සංගමය<br>අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන |
| 6. නිවස මුල්කරගත් සහන සත්කාර සේවයේදී මහජන සෞඛ්‍ය හෙද නිලධාරියාට ඇති භූමිකාව සහතික කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස්/උපදේශන ලබාදීම | පවුල් මට්ටමින් සහන සත්කාරය ලබා දීමේදී මහජන සෞඛ්‍ය හෙද නිලධාරියා සක්‍රීය දායකත්වයක් ලබාදීම | සහන සත්කාරයෙහි යෙදී සිටින මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් සංඛ්‍යාව | මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් සඳහා වන කළමනාකරණ තොරතුරු පද්ධතිය | 2018-2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරි 1),<br>අධ්‍යක්ෂ - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ/හෙද සේවා (මහජන සෞඛ්‍යය) |

## 3. ආයතනික සහ ප්‍රජා මට්ටම්වල සහන සත්කාර සේවා සැපයීම සඳහා විවිධ අංශවල පුහුණුවලත් මානව සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය කර ලබා දීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. සහන සත්කාරය සඳහා මානව සම්පත් යෙදවීමේ සැලැස්මක් සම්පාදනය කිරීම *(ඇමුණුම 1 සහ 2)* | විවිධ වර්ගීකරණ හා මට්ටමවල සහන සත්කාර සඳහා අවශ්‍ය වන මානව සම්පත් හඳුනා ගැනීම | සහන සත්කාරය සඳහා වන මානව සම්පත් යෙදවීමේ සැලැස්මක් තිබීම | වාර්තා | 2018-2020 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (සැලසුම්)<br>අධ්‍යක්ෂ (සැලසුම්) |
| 2. සහන සත්කාරය පිළිබඳ පශ්චාත් වෛද්‍ය විද්‍යා ආචාර්ය උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීම | සහන සත්කාර වෛද්‍ය විද්‍යාව සම්බන්ධ සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන් ශ්‍රී ලංකාවේ සිටීම | සහන සත්කාර පිළිබඳ පශ්චාත් වෛද්‍ය විද්‍ය ආචාර්ය උපාධිය සඳහා බඳවාගෙන ඇති නවකයින් සංඛ්‍යාව | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අයතනයේ වාර්තා | 2018- 2022 | ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය<br>සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (සැලසුම්)<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1),<br>අධ්‍යක්ෂ - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>අධ්‍යක්ෂ - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය |
| 3. අදාල විශේෂඥ පුහුණු වැඩසටහන්වලට සහන සත්කාරය පිළිබඳ විෂය ඒකකයක් අන්තර්ගත කිරීම | විවිධ සෞඛ්‍ය පසුතලවල සිට සහන සත්කාර සේවාව ලබා දීම | සහන සත්කාර විෂය ඒකකය අන්තර්ගත වන විශේෂඥ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්තා | 2018-2022 | අධ්‍යක්ෂ - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අයතනය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1),<br>අධ්‍යක්ෂ - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යන මණ්ඩලය<br>වෘත්තීය විද්‍යාල |
| 4. වෛද්‍ය නිලධාරීන් සඳහා සහන සත්කාරය පිළිබඳ පශ්චාත් වෛද්‍ය විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කර පවත්වාගෙන යාම | වෛද්‍ය නිලධාරීන් සඳහා සහන සත්කාර වෛද්‍ය සේවා සැපයීම පිළිබඳව විශේෂ පුහුණුවක් ලබාදීම | සහන සත්කාරය පිළිබඳ පශ්චාත් වෛද්‍ය විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අයතනයේ වාර්තා | 2018-2022 | අධ්‍යක්ෂ - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අයතනය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1),<br>අධ්‍යක්ෂ - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5. හෙද නිලධාරීන් සඳහා සහන සත්කාරය මුල් කර ගත් පශ්චාත් ප්‍රාථමික ඩිප්ලෝමා වැඩසටහනක් ආරම්භ කර පවත්වාගෙන යාම | හෙද නිලධාරීන්ට සහන සත්කාර සේවා පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදීම | හෙද නිලධාරීන් සඳහා සහන සත්කාර සේවා පශ්චාත් ප්‍රාථමික ඩිප්ලෝමා වැඩසටහනක් තිබීම. සහන සත්කාර හෙද සේවා පිළිබඳ පශ්චාත් ප්‍රාථමික ඩිප්ලෝමාව සම්පූර්ණ කර ඇති හෙද නිලාධාරීන්ගේ සංඛ්‍යාව | පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල් වාර්තාව | 2018 -2022 | අධ්‍යක්ෂ - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>අධ්‍යක්ෂ - (හෙද අධ්‍යාපනය)<br>විදුහල්පති (පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල) |
| 6. වෛද්‍ය විද්‍යා ප්‍රාථමික/පශ්චාත් උපාධි පුහුණු, හෙද සහ සෞඛ්‍යය හා සම්බන්ධ අනෙකුත් වැඩසටහන්වලට සහන සත්කාරයේ අංගයන් ඇතුලත් කිරීම | සෞඛ්‍ය සේවකයින් සඳහා වන මූලික පුහුණුවේදී සහන සත්කාර සේවා සඳහා අවශ්‍ය නිපුණතාවයන් වර්ධනය කර ගැනීමට ඔවුන් පුහුණු කිරීම | එක් එක් පුහුණු වැඩසටහන්වල සහන සත්කාරය පිළිබඳව අධ්‍යයන පැය ගණන / පාඨමාලා කාලය | ඉගැන්වීමේ වැඩසටහන් වාර්තා සහ විගණන වාර්තා | 2018 - 2022 | අධ්‍යක්ෂ - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1),<br>අධ්‍යක්ෂ - හෙද සේවා (පුහුණු)<br>පීඨාධිපති / වෛද්‍ය පීඨය, හෙද සේවා හෝ සම සෞඛ්‍ය විද්‍යාවන් වෘත්තිකයන්ගේ සංගම් |
| 7. වෛද්‍යවරුන්, හෙද නිලධාරීන් සහ ඖෂධවේදීන් සඳහා සහන සත්කාරය හා සම්බන්ධ සේවා පුහුණු වැඩසටහන් සම්පාදනය කර පවත්වාගෙන යාම | සෞඛ්‍ය සේවකයින්ට සහන සත්කාර සේවය පිළිබඳව නිතිපතා පුහුණුවක් ලබාදීම | එක් එක් වර්ගීකරණයන් යටතේ සහන සත්කාර පුහුණුව ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | පරිපාලන වාර්තා<br>විගණන | 2018 - 2022 | අධ්‍යක්ෂ - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - බෝනොවන රෝග<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 2),<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>අධ්‍යක්ෂ - හෙද සේවා (වෛද්‍ය සේවා)<br>වෘත්තීය සංගම් |
| 8. වෛද්‍ය වෘත්තිකයින්ට සහ සහන සත්කාර සේවා කණ්ඩායම්වලට අවශ්‍ය තොරතුරු ලබා දීම උදෙසා උපකාරක සේවා මාධ්‍යයක් (වෙබ් අඩවියක්, විද්‍යුත් තැපැල්, ක්ෂණික ඇමතුම් අංකයක්) ඇති කිරීම | සෞඛ්‍ය සේවා ක්‍රියාකාරීන්ගේ අවශ්‍යතාවය පරිදි අත්‍යවශ්‍ය තොරතුරුවලට ප්‍රවේශ වීමේ හැකියාව තිබීම | සහන සත්කාර සඳහා උපකාරක සේවයක් තිබීම | උපකාරක සේවා වාර්තාව | 2019 - 2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>සහන සත්කාරය සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව |

## 4. සහන සත්කාර සේවාවන් අවශ්‍ය වන රෝගීන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට එම සේවාවන්, අදාල ක්‍රියාපටිපාටීන් වලට සහ මාර්ගෝපදේශවලට අනුකූලව අවශ්‍යවන ස්ථානයේ හා අවශ්‍ය අවස්ථාවලදී ලැබෙන බවට තහවුරු කිරීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. සහන සත්කාර සේවා සැපයීම සඳහා ක්‍රියාපටිපාටීන් සහ මාර්ගෝපදේශයන් සම්පාදනය කිරීම | සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලය සඳහා සහන සත්කාර සේවා ක්‍රියාපටිපාටීන් සහ මාර්ගෝපදේශයන් සම්පාදනය කර තිබීම | ක්‍රියාපටිපාටීන් සහ මාර්ගෝපදේශයන් පැවතීම | ක්‍රියාපටිපාටීන් සහ මාර්ගෝපදේශයන් පිළිබඳ වාර්තා | 2018 - 2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1 හා 2),<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>අධ්‍යක්ෂ - බෝනොවන රෝග<br>අධ්‍යක්ෂ - ප්‍රාථමික සත්කාරය<br>ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය<br>වෘත්තීය විද්‍යාල |
| 2. සහන සත්කාර සේවා ලබාදෙන ස්ථානවල අදාල ක්‍රියාපටිපාටීන් සහ මාර්ගෝපදේශයන් තබාගැනීම සඳහා පහසුකම් සැපයීම | සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය සඳහා සහන සත්කාර සේවා ක්‍රියාපටිපාටීන් සහ මාර්ගෝපදේශයන් (දෘඪ සහ මෘදු පිටපත් ලෙසින්) ලබාගත හැකිවීම | මාර්ගෝපදේශයන් ඇති සෞඛ්‍ය සත්කාර ඒකකවල සංඛ්‍යාව සහ ප්‍රතිශතය | සමීක්ෂණ වාර්තා | 2019 -2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1 හා 2),<br>රෝහල් අධ්‍යක්ෂ (වෛද්‍ය සේවා)<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>උපදේශකවරු |
| 3. සායනික විගණන මගින් සහන සත්කාර සේවා ක්‍රියාපටිපාටීන් සහ මාර්ගෝපදේශයන්ට අනුගත වීම සමාලෝචනය කිරීම | දැනට පවත්නා සම්පත් යොදා ගනිමින් හැකි උපරිම සේවාවක් සැපයීම | මාර්ගෝපදේශයන් අනුව සත්කාරය ලැබූ රෝගීන්ගේ අනුපාතය | විගණන වාර්තා | 2018 -2022 | රෝහල් වෛද්‍ය සේවා අධ්‍යක්ෂ<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>උපදේශකයින් |
| 4. ගුණාත්මකභාවය ඇගයීමේ මෙවලම්වලට සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කරන ව්‍යාපෘතිවලට සහන සත්කාර සේවාවල අංගයන් ඇතුලත් කිරීම | සෑම මට්ටමකදීම ගුණාත්මක සහන සත්කාර සේවාවක් කෙටි කාලපරාසයක් අතුලත ලබාදීම තහවුරු කිරීම | සහන සත්කාර සේවා සපයන ස්ථාන වලට ගුණාත්මකබව ඇගයීමේ මෙවලම් ලබාදී ඇති අනුපාතය | තත්ව සහතික වාර්තා<br>විගණන වාර්තා | 2018 -2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1 හා 2),<br>අධ්‍යක්ෂ - සෞඛ්‍ය සේවා ප්‍රමිති<br>රෝහල් වෛද්‍ය සේවා අධ්‍යක්ෂ<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>උපදේශකවරු |

## 5. සහන සත්කාරය තෘතීයක, ද්විතීක සහ ප්‍රාථමික මෙන්ම ප්‍රජා යන සියලුම මට්ටම්වලට ලබා දීම සඳහා අත්‍යවශ්‍ය වන ඖෂධ සහ තාක්ෂණ ඇති බවට සහතික කරගැනීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. පාලනය කරන ඖෂධ, විශේෂයෙන් මෝෆීන් වැනි නිර්දේශිත ඖෂධ ලබාදීම සම්බන්ධයෙන් පවත්නා වත්මන් නීතිරීති සංශෝධනය කිරීමට යොමුවීම | වේදනාව සමනය කරන ඖෂධ ප්‍රමාණවත් ලෙසින් නිර්දේශ කිරීම | අදාල සංශෝධනයන් පැවතීම | අන්තාරයකර ඖෂධ පනතට සංශෝධන | 2018 - 2020 | නීති කෙටුම්පත්කරු දෙපාර්තමේන්තුව<br>ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය<br>නීති නිලධාරි - සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 2. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් වැඩිහිටියන්ට සහ ළමුන්ට සහන සත්කාරයෙදී ලබාදීමට නිර්දේශකර ඇති ආදර්ශ අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුව අත්‍යවශ්‍ය ඖෂධ ජාතික ලැයිස්තුවට ඇතුලත් කිරීම | සෞඛ්‍ය සේවා ස්ථාන වලින් සහන සත්කාර සේවා සඳහා අත්‍යවශ්‍ය ඖෂධ ලබාගැනීමට ඇති හැකියාව | අත්‍යවශ්‍ය ඖෂධ ජාතික ලැයිස්තුවට ඇතුලත් කර ඇති ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සහන සත්කාරයෙදී ලබාදීමට නිර්දේශකර ඇති අත්‍යවශ්‍ය ඖෂධ සංඛ්‍යාව | අත්‍යවශ්‍ය ඖෂධ ජාතික ලැයිස්තුව | 2018 - 2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්<br>ජාතික ඖෂධ නියාමන අධිකාරිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - වෛද්‍ය සැපයුම් අංශය<br>වෘත්තීය විද්‍යාල |
| 3. සහන සත්කාර පහසුකම් ලබාදෙන සියළුම මට්ටම්වල සෞඛ්‍ය මධ්‍යස්ථානවලට අවශ්‍ය වන ඖෂධ ලැයිස්තුවක් සැකසීම | සහන සත්කාර ඖෂධ සෑම මට්ටමකින්ම ලබාගැනීමට ඇති හැකියාව | ලැයිස්තුවේ ඇති අදාල සත්කාර මට්ටම් වලට අවශ්‍යකරන සහන සත්කාර ඖෂධ පැවතීම | සමීක්ෂණ වාර්තා | 2018- 2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - වෛද්‍ය සැපයුම් අංශය<br>අධ්‍යක්ෂ - වෛද්‍ය සැපයුම් අංශය<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>වෘත්තීය විද්‍යාල |
| 4. සියලුම සත්කාර මට්ටම් සඳහා අවශ්‍ය කරන සහන සත්කාර ඖෂධ ඇතිබවට සහ ඒවාවල අඛණ්ඩ සැපයුම සහතික කිරීම | වසර පුරාවටම සහන සත්කාර ඖෂධ ප්‍රමාණවත් ලෙසින් ලබාගැනීමට ඇති හැකියාව | එක් එක් දිස්ත්‍රික්කවල ගිලින මෝෆීන් තිබෙන රෝහල් වල අනුපාතය | වාර්තා සහ ප්‍රතිලාභ | 2018- 2022 | අධ්‍යක්ෂ- වෛද්‍ය සැපයුම් අංශය<br>අධ්‍යක්ෂ/වෛද්‍ය අධිකාරී (ශික්ෂණ රෝහල්), පළාත් මහ රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල්, මූලික රෝහල්,<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 5. සහන සත්කාරයේ එක් එක් මට්ටම්වලට අවශ්‍යතා අනුව අවශ්‍ය කරන වෛද්‍ය තාක්ෂණය නිශ්චය කර ඒවා ලබාගැනීම | අවශ්‍ය වෛද්‍ය තාක්ෂණික උපකරණ (වේදනා පාලනය සඳහා සිරින්ජර්, ඉන්ෆියුෂන් පොම්ප, PEG ටියුබ් ආදිය) ලබාගැනීමට හැකිවීම | එක් එක් දිස්ත්‍රික්කවල සහන සත්කාරය සඳහා සුවිශේෂී වෛද්‍ය තාක්ෂණ පහසුකම් තිබෙන රෝහල්වල අනුපාතය | වාර්තාව | 2018-2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - වෛද්‍ය සැපයුම් අංශය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - ජෛව වෛද්‍ය ඉංජිනේරු<br>අධ්‍යක්ෂ - වෛද්‍ය සැපයුම් අංශය<br>අධ්‍යක්ෂ/වෛද්‍ය අධිකාරී (ශික්ෂණ රෝහල්), පළාත් මහ රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල්, මූලික රෝහල්,<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>වෘත්තීය විද්‍යාල |

## 6. සහන සත්කාරය ලබා දීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග හවුල්කාරීත්වයක් ගොඩනගා ගැනීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. සහන සත්කාර සේවයේ යෙදී සිටින රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන හඳුනාගැනීම | සහන සත්කාර සේවා සපයන්නන් අතර ජාලයක් නිර්මාණය කිරීම සහ ඔවුනොවුන්ගේ භූමිකා සහ ක්ෂේත්‍රයන් පිළිබඳ අවබෝධයක් ලබා දීම | ජාතික හා උප ජාතික මට්ටමවල තිබෙන්නාවු සංවිධානවල ලැයිස්තුවක් තිබීම | වාර්තා | 2018 - 2022 | අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ/වෛද්‍ය අධිකාරී (ශික්ෂණ රෝහල්) පළාත් මහ රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල්, මූලික රෝහල්, |
| 2. සහන සත්කාරය ලබා දෙන සහ ඒ සඳහා සම්බන්ධීකරණය කරන සංවිධාන අතර ජාතික හා කලාපීය ජාල ගොඩනැගීම | සම්බන්ධීකරණ සේවා ප්‍රතිපාදන සපයා ඇති බව සහතික කිරීම | සක්‍රීය සම්බන්ධීකරණය සේවා සංඛ්‍යාව | වාර්තා | 2018 - 2022 | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>සමාජ සේවා අමාත්‍යාංශය<br>අධ්‍යක්ෂ - බෝනොවන රෝග<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>අධ්‍යක්ෂ - ප්‍රාථමික සත්කාර<br>ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය<br>ශ්‍රී ලංකා සහන සත්කාර සංගමය<br>රාජ්‍ය නොවන සංවිධාන |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| | | | | | |
| 3. සඟන සත්කාරය ලබා දීම සඳහා ප්‍රජා සහ ආගමික සංවිධානවල සහයෝගය ලබා ගැනීමට උපදෙස් සැපයීම | ප්‍රජා මූලික සංවිධාන සහ ස්වේච්ඡා ක්‍රියාකාරීන් හරහා විවිධ අංශ වෙනුවෙන් සඟන සත්කාර සේවා ගෘහස්ථ මට්ටමින් ලබා දීම | සඟන සත්කාරයෙහි යෙදී සිටින ප්‍රජා සහ ආගමික සංවිධානවල සංඛ්‍යාව | සමීක්ෂණ වාර්තා | 2018 - 2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>සමාජ සේවා අමාත්‍යාංශය<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 4. සඟන සත්කාරය ශක්තිමත් කිරීම උදෙසා ජාත්‍යන්තර සංවිධාන සමග පුළුල් ලෙස ජාලගතවීම | සඟන සත්කාරය ශක්තිමත් කිරීමට ජාත්‍යන්තර සංවිධානවල සහය සහ අත්දැකීම් ලබාගැනීම | සඟන සත්කාරයට දායක වී ඇති ජාත්‍යන්තර සංවිධාන සංඛ්‍යාව | වාර්තා | 2018 - 2022 | අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - බෝනොවන රෝග<br>වෘත්තීය විද්‍යාල<br>ලෝක සෞඛ්‍ය සංවිධාන දේශීය කාර්යාලය |

## 7. සහන සත්කාරය උදෙසා පවුලේ සාමාජිකයන්, රැකබලා ගන්නන් මෙන්ම මහජනයා සවිබල ගැන්වීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. සහන සත්කාර සේවා පිළිබඳව සහ ඒ වෙනුවෙන් තමන්ට ඇති වගකීම් මෙන්ම එම සේවා ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම | සහන සත්කාරයේ අවශ්‍යතාවය, සේවය සහ තමන්ගේ වගකීම් ගැන මහජනයා තුළ ඇති දැනුවත්භාවය | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | සමීක්ෂණ | 2018 - 2022 | අධ්‍යක්ෂ - බෝ නොවන රෝග<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්දන වැඩසටහන<br>අධ්‍යක්ෂ - ප්‍රාථමික සත්කාර<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>වෘත්තීය සංවිධාන<br>වෘත්තීය විද්‍යාල |
| 2. සහන සත්කාරය ලබා දීමට පවුලේ සාමාජිකයන් හා සත්කාරය ලබාදෙන්නන් සවිබල ගැන්වීම | පවුලේ සාමාජිකයන් හා සත්කාර කරන්නන්ට පුහුණුව ලබා දී ඔවුන් සවිබලගැන්වීම | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව<br><br>වැඩිදියුණු කරගත් අධ්‍යාපනික තොරතුරු සංඛ්‍යාව | වාර්තා | 2018- 2022 | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>සමාජ සේවා අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා සුබසාධන අමාත්‍යාංශය<br>අධ්‍යක්ෂ - බෝ නොවන රෝග<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්දන වැඩසටහන<br>අධ්‍යක්ෂ - ප්‍රාථමික සත්කාරය<br>අධ්‍යක්ෂ - වැඩිහිටි සහ ආබාධ<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>ගිලාන ගිමන්හල්<br>රාජ්‍ය නොවන සංවිධාන |
| 3. සහන සත්කාරය අවශ්‍ය වන රෝගීන්ට ස්වයං සහන / උපකාරක කණ්ඩායම් පිහිටුවීමට පහසුකම් ලබාදීම | ප්‍රජා සංවිධාන පිහිටු වීම | කණ්ඩායම් සංඛ්‍යාව | වාර්තා | 2018- 2020 | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>සමාජ සේවා අමාත්‍යාංශය<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>රාජ්‍ය නොවන සංවිධාන<br>සිවිල් සංවිධාන |

## 8. සහන සත්කාර අවශ්‍යතාවයන් තක්සේරු කිරීමට සහ එම සේවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැකැස්මක් නිර්මාණය කිරීම හා ඒ සම්බන්ධ පර්යේෂණ දිරිගැන්වීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. ජාතික සෞඛ්‍ය පර්යේෂණ න්‍යාය පත්‍රයට සහන සත්කාර සම්බන්ධ පර්යේෂණද ඇතුලත් කිරීම | යාවත්කාලීන කරන ලද සහන සත්කාර පර්යේෂණ සුරක්ෂිතාගාරය | යාවත්කාලීන කරන ලද සහන සත්කාර පර්යේෂණ සුරක්ෂිතාගාරයක් තිබීම | පර්යේෂණ සුරක්ෂිතාගාර වාර්තා | 2018 - 2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>අධ්‍යක්ෂ - පර්යේෂණ<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන |
| 2. සහන සත්කාරය සඳහා වන පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම | සහන සත්කාර පර්යේෂණ අවශ්‍යතා ප්‍රමුඛතා අනුව හඳුනාගෙන තිබීම | සහන සත්කාර පර්යේෂණ සඳහා ප්‍රමුඛතා අනුව ශ්‍රේණිගත කරන ලද ලැයිස්තුවක් තිබීම | සහන සත්කාර පර්යේෂණ අවශ්‍යතාවල වාර්තා | 2018 - 2022 | සහන සත්කාරය සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>අධ්‍යක්ෂ - පර්යේෂණ |
| 3. සහන සත්කාර හා සම්බන්ධ පර්යේෂණ සඳහා පහසුකම් ලබාදීම (මූල්‍ය සහ තාක්ෂණ ප්‍රතිපාදන) | සහන සත්කාර හා සම්බන්ධ පර්යේෂණ සෑම මට්ටමකින්ම සිදුකරනු ලැබීම | සහන සත්කාර හා සම්බන්ධ පර්යේෂණ සංඛ්‍යාව | සහන සත්කාර පිළිබඳව කෙරුණු පර්යේෂණ වාර්තා | 2018 - 2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>අධ්‍යක්ෂ - පර්යේෂණ<br>විශ්ව විද්‍යාල |
| 4. සහන සත්කාර හා සම්බන්ධ පර්යේෂණ ප්‍රතිඵල බෙදා හැරීමට හා සොයාගැනීම් යොදා ගැනීමට පියවර ගැනීම | සහන සත්කාර සේවා ලබාදීම පර්යේෂණ වලින් ලබාගත් සාධකයන් මත පදනම්ව වෙනස් කර තිබීම | සහන සත්කාර සේවා ලබාදීම සඳහා භාවිත කරන ලද පර්යේෂණ සාධක සංඛ්‍යාව | ප්‍රකාශයට පත් කර ඇති පර්යේෂණ වාර්තා | 2018-2022 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ<br>අධ්‍යක්ෂ - පර්යේෂණ<br>වෘත්තීය විද්‍යාල<br>විශ්ව විද්‍යාල |
| 5. ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග සංසන්දනය කරනු පිණිස සහ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කරන බව නිශ්චය කරනු සඳහා සහන සත්කාර සපයන ස්ථාන ආශ්‍රිතව සායනික විගණන පැවැත්වීම සහ එවා ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ප්‍රමිතීන් සහ ආකෘති හඳුනා ගැනීම | සහන සත්කාර සේවා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ දේශීය මාර්ගෝපදේශයන් සමග සැසඳීම | සහන සත්කාරය සම්බන්ධයෙන් පැවැත්වූ සායනික විගණන සංඛ්‍යාව | සායනික විගණන වාර්තා | 2020-2022 | රෝහල් අධ්‍යක්ෂකයින්/ වෛද්‍ය අධිකාරීවරුන්<br>වෘත්තීය විද්‍යාල |

## 9. ඵලදායි ලෙස සහන සත්කාරය ලබා දීමට අවශ්‍ය කරන මුල්‍ය ප්‍රතිපාදන හා අනෙකුත් සම්පත් වෙන් කර ඇති බවට තහවුරු කර ගැනීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. සහන සත්කාර සේවා ජාතික හා පළාත් මට්ටම්වලින් තිරසාරව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මුල්‍යමය ප්‍රතිපාදන විධිමත්ව ලැබෙන බව තහවුරු කරගැනීම | සහන සත්කාර සේවා ඵලදායි පිරිවැයක් යටතේ ලබා දීමට මුල්‍ය යාන්ත්‍රණයක් පිහිටුවා තිබීම | අයවැයේ සමස්ත ප්‍රතිශතයක් ලෙසින් සහන සත්කාරයට වෙන් කරන ලද මුල්‍ය ප්‍රතිපාදන | වාර්ෂික අයවැය ප්‍රතිපාදන | 2018-2022 | මුදල් අමාත්‍යාංශය<br>සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (සැලසුම්)<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය අධිකාරී 1 හා 2)<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (බෝ නොවන රෝග)<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (මුල්‍ය)<br>රෝහල් අධ්‍යක්ෂයින්/වෛද්‍ය අධිකාරී<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 2. පෞද්ගලික අංශයේ සහන සත්කාර සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීමට පෞද්ගලික අංශය දිරි ගැන්වීම | සහන සත්කාර සේවා පෞද්ගලික අංශයෙන් ලබාගත හැකිවීම | සහන සත්කාර සේවා සපයන පුද්ගලික සෞඛ්‍ය සේවා ආයතන සංඛ්‍යාව | වාර්තා | 2018-2022 | අධ්‍යක්ෂ - පුද්ගලික සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධනය<br>පුද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන |
| 3. සහන සත්කාර ආරම්භ කිරීම් සඳහා රාජ්‍ය -පෞද්ගලික හවුල් ව්‍යාපෘති (PPP) දිරි ගැන්වීම | සහන සත්කාර සඳහා රාජ්‍ය -පෞද්ගලික හවුල් ව්‍යාපෘති (PPP) ආරම්භ කර තිබීම | සහන සත්කාර සම්බන්ධව ඇති රජයේ පුද්ගලික හවුල් ව්‍යාපෘති සංඛ්‍යාව | වාර්තා | 2018-2022 | අධ්‍යක්ෂ - පුද්ගලික සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධනය<br>පුද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>රෝහල් අධක්ෂකයින්<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |

## 10. සහන සත්කාර සේවා සැපයීම සඳහා අවශ්‍ය වන නෛතික ක්‍රියාරාමුව ශක්තිමත් කිරීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. පවතින නීතිමය ප්‍රතිපාදන හඳුනාගෙන සහන සත්කාරය ලබාදීම සඳහා ඒවා යොදා ගැනීම | සහන සත්කාර සේවා අවශ්‍ය වන රෝගීන් සහ එම සේවය ලබා දෙන්නන් නීතිමය රැකවරණ ලබා තිබීම | නීතිමය ක්‍රියාරාමුවක් තිබීම | නීති වාර්තා | 2018-2022 | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>නීති නිලධාරී - සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන |
| 2. සහන සත්කාර සේවා ලබාදීම සඳහා අවශ්‍ය නීතිමය අවශ්‍යතාවයන් හඳුනාගෙන නව නෛතික ක්‍රියාපටිපාටීන් සම්පාදනය කිරීම | සහන සත්කාර සේවා අවශ්‍ය වන රෝගීන් සහ එම සේවය ලබා දෙන්නන් නීතිමය රැකවරණ ලබා තිබීම | නව නීතිමය ක්‍රියාරාමුවක් තිබීම | නීති වාර්තා | 2018-2022 | ලේකම් - සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්<br>නීති නිලධාරී - සෞඛ්‍ය අමාත්‍යාංශය නීතිපති දෙපාර්තමේන්තුව<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන |

## 11. සහන සත්කාර සේවා සඳහා අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ ක්‍රියාරාමුවක් සම්පාදනය කර ගැනීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිදානය | දර්ශකය | තහවුරු කරගැනීමේ ක්‍රම | කාල රාමුව | වගකීම |
|---|---|---|---|---|---|
| 1. සහන සත්කාර සේවා සඳහා අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාරාමු නිර්මාණය කිරීමට දර්ශක පිහිටුවීම | සෑම මට්ටමකින්ම සහන සත්කාර සේවා සඳහා වන අධීක්ෂණ සහ ඇගයීම් දර්ශක නිර්මාණය කර තිබීම | අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාරාමුවක් පැවතීම | වාර්තාව | 2018-2022 | අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන |
| 2. කළමනාකරණ තොරතුරු පද්ධතියට (MIS) සහන සත්කාර අධීක්ෂණ සහ ඇගයීම් දර්ශක ඇතුලත් කිරීම | කළමනාකරණ තොරතුරු පද්ධතියට සෑම මට්ටමකම සත්කාර සේවාවන් සඳහා සහන සත්කාර දර්ශක ඇතුලත් කර තිබීම | සහන සත්කාර අධීක්ෂණ සහ ඇගයීම් දර්ශක සහිතව කළමනාකරණ තොරතුරු පද්ධතියක් පැවතීම | සහන සත්කාරය සඳහා වන කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) | 2018-2020 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (සැලසුම්)<br>අධ්‍යක්ෂ - තොරතුරු<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>රෝහල් අධ්‍යක්ෂකයින්/වෛද්‍ය අධිකාරීන්<br>අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්ධන වැඩසටහන |

විස්තරාත්මක සැලැස්මක් මගින් ජාතික ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීමක් සිදු කරයි. ඒ අනුව ක්‍රමෝපායික ක්‍රියාරාමුව සඳහා අනුමැතිය ලැබුනු පසුව සියලුම පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමෙන් පසු ජාතික ක්‍රමෝපායේ ප්‍රගතිය මැනීම සඳහා වන අධීක්ෂණ හා ඇගයීම් සැලසුම් සම්පාදනය කරෙනු ඇත.

## යොමුකිරීම්


1. ආසියා ශාන්තිකර ගිලන් නිවස්න සහන සත්කාර ජාලය (2017). 2017.03.05 දිනැති ආසියා ශාන්තිකර සහන ගිලන් නිවස්න සත්කාර ජාලය  විසින් එවන ලද  ''ශ්‍රී ලංකාවේ සහන සත්කාර සේවා ප්‍රවර්ධනය කිරීම'' යන ලිපිය"
2. සුරේෂ් කුමාර් (2012). ''ශ්‍රී ලංකාවේ සහන සත්කාරය'' ජාත්‍යන්තර පරමාණු බලශක්ති ආයතනයට ඔක්තෝම්බර් 2012 ඉදිරිපත් කරන මෙහෙයුම් වාර්තාව.
3. සෞඛ්‍ය අමාත්‍යාංශය (2015). ශ්‍රී ලංකාවේ පිළිකා වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සහ මුලෝපායික රාමුව.
4. සහන සත්කාරය සහ ජීවිතාන්ත සත්කාර කාර්ය බලකාය (2017). සංකල්ප ලියවිල්ල. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය
5. ශ්‍රී ලංකාවේ පිළිකාවේදීන්ගේ විද්‍යාලය (2017). ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා වන සහන සත්කාරය පිළිබඳ නිර්දේශ 21.03.2017
6. ලෝක සෞඛ්‍ය සංවිධානය (2016). සහන සත්කාර සේවා සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම: වැඩසටහන් කළමනාකරුවන් සඳහා වන මාර්ගෝපදේශය
7. ශ්‍රී ලංකාවේ සහන සත්කාර සංගමය (2016). ශ්‍රී ලංකාවේ සහන සත්කාර සංගමය විසින් 2016-2025 ජාතික සෞඛ්‍ය ක්‍රමෝපායික ප්‍රධාන සැලැස්ම සඳහා ඉදිරිපත් කරන ලද සහන සත්කාරය සඳහා වන යෝජනා
8. මරේ (2015). "සහන සත්කාරය සහ රෝගයේ ගමන් පථය'', BMJ;330:1007-1011